කෘෂිකර්ම අමාත්‍යාංශය
கமத்தொழில் அமைச்சு
Ministry of Agriculture

පොහොර නිෂ්පාදන හා සැපයුම්, රසායනික පොහොර හා කෘමිනාශක භාවිත නියාමන රාජ්‍ය අමාත්‍යාංශය
உரஉற்பத்தி மற்றும் வழங்கல்கள், இரசாயன உரங்கள் மற்றும் கிருமிநாசினி பாவனை ஒழுங்குறுத்துகை இராஜாங்க அமைச்சு
State Ministry of Production and Supply of Fertilizer and Regulation of Chemical Fertilizer and Insecticide Use

නො. 80/5,ගොවිජන මන්දිරය, රජමල්වත්ත පටුමග, බත්තරමුල්ල
இல.80/5, கொவி ஜன மந்திரய, ரஜமல்வத்த ஒழுங்கை, பத்தரமுல்லை
No. 80/5, Govijana Mandiraya, Rajamalwatta Avenue, Battaramulla

| | | | |
|---|---|---|---|
| මගේ අංකය. / எனது இல. / My No. | 7/1/3/2020-21 මහ / චක්‍රලේඛ | ඔබේ අංකය. / உமது இல. / Your No. | දිනය. / திகதி. / Date. 2020.10. 09 |

ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්,
සියලුම දිස්ත්‍රික් භාර ගොවිජන සංවර්ධන
නියෝජ්‍ය / සහකාර කොමසාරිස්වරුන්,
සියලුම ගොවිජන සංවර්ධන ප්‍රාදේශීය නිලධාරීන්,

මහවැලි අධ්‍යක්ෂ ජනරාල්,
වාරි කළමනාකරණ අංශයේ අධ්‍යක්ෂ,

කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්,
පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂවරුන්,

සභාපති, ලංකා පොහොර සමාගම,
සභාපති, කොළඹ කොමර්ෂල් පොහොර සමාගම,

***<u>නොමිලේ පොහොර බෙදාහැරීමේ චක්‍රලේඛ 6 / 2020 - සංශෝධන (I) – 2020 / 21 මහ කන්නය</u>***

1. පොහොර නිෂ්පාදන හා සැපයුම්, රසායනික පොහොර හා කෘමිනාශක භාවිත නියාමන රාජ්‍ය අමාත්‍යාංශය මඟින් නිකුත් කරන ලද, 2020 / 21 මහ කන්නයේ වී ගොවිතැන සඳහා නොමිලේ පොහොර බෙදාහැරීමේ උපදෙස් ඇතුළත් ***නොමිලේ පොහොර බෙදාහැරීමේ චක්‍රලේඛ : 6 / 2020*** ට අදාළව, සහනාධාර මත පොහොර බෙදා හැරීමේ චක්‍රලේඛ 4 / 2019 හි කරුණු අංක 14, ගොවීන්ට සහනාධාර පොහොර අලෙවි කිරීම යන උප මාතෘකාව යටතේ පහත උප වගන්ති අලුතින් ඇතුළත් කරනු ලැබේ.

14.2.1. යම් ගොවියකු හෙක්ටයාර 1 (අක්කර 2.5) ක් හෝ ඊට වැඩි බිම් ප්‍රමාණයක් වී වගා කරන අවස්ථාවල දී, ඔහුට හිමි නිර්දේශිත යූරියා පොහොර ප්‍රමාණය දෙවතාවක දී නිකුත් කිරීමට කටයුතු කළ යුතු ය.

14.10. වී පොහොර සහනාධාර වැඩසටහන යටතේ සහනාධාර පොහොර කි.ග්‍රෑ. 300 ක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් ලබා ගන්නා ගොවීන්ගේ අස්වැන්නෙන් අවමය කි.ග්‍රෑ. 1000 ක් හෝ ගොවීන් ගේ අභිමතය පරිදි ඊට වැඩි ප්‍රමාණයක් වී අලෙවි මණ්ඩලය වෙත ලබා දීම අනිවාර්ය වන අතර 2021 යල කන්නයේ සිට ඉහත කාණ්ඩය තුළට ඇතුළත් වන ගොවීන්ට සහනාධාර පොහොර නිකුත් කරනු ලබන්නේ වී අලෙවි මණ්ඩලය මඟින් ලබාදුන් කුවිතාන්සිය ඉදිරිපත් කරන්නේ නම් පමණි.

14.10.1. ඉහත 14.10. යටතේ සඳහන් කරුණු පිළිබඳව ගොවීන් නොපමාව දැනුවත් කිරීමේ වගකීම දිස්ත්‍රික් පොහොර අනු කමිටුව සතු වේ.

එම්.එන්.රණසිංහ
රාජ්‍ය ලේකම්
පොහොර නිෂ්පාදන හා සැපයුම්, රසායනික පොහොර හා
කෘමිනාශක භාවිත නියාමන රාජ්‍ය අමාත්‍යාංශය

පිටපත් සඳහා කරුණාකර අනෙක් පිට බලන්න

ලේකම් / செயலாளர் / Secretary — දුරකථන / தொலைபேசி / Telephone - 011-2879048; ඊ-මේල් / மின்னஞ்சல் / e- mail - secretary@agrimin.gov.lk; ෆැක්ස් / தொலைநகல் / Fax - 011-2863497
කාර්යාලය / அலுவலகம் / Office — දුරකථන / தொலைபேசி / Telephone - 011-2872093, 011-2872097; ඊ-මේල් / மின்னஞ்சல் / e- mail - info@agrimin.gov.lk; ෆැක්ස් / தொலைநகல் / Fax - 011-2868910